JMC vLearning
"your virtual learning partner"

# සහතිකවීම් කාර්යභාරයන් සහ සම්බන්ධිත සේවා


## AAT අදියර III

## FCA - මූල්‍ය පාලනයන් හා විගණනය

ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917




## සහතික වීමේ සේවාවන් (Assurance Services)

### හැඳින්වීම

ව්‍යාපාර පිළිබඳ ආර්ථිකමය තීරණයක් ගැනීම සඳහා තොරතුරු ලබාගැනීමේ හැකියාව සහ නූතන ව්‍යාපාර ආයතනවල සංකීර්ණත්වය යන කාරණාවන් සමග එක්ව ගත් කළ එම තොරතුරුවල ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳව සහතිකවීම් මත අවශ්‍යතාවය මතු වේ. නූතන ව්‍යාපාරික පරිසරය තුළ ආර්ථිකමය තීරණ ගැනීම අතිශය වැදගත් සාධකයක් වේ. උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත මෙම ආර්ථිකමය තීරණ ගැනීම සඳහා යොදාගන්නා තොරතුරුවල විශ්වාසනීයත්වය හා ගුණාත්මකභාවය ඒවා පරිශීලනය කරන්නන් විසින් සලකා බලන වැදගත් සාධකයන් වේ. මෙවන් තත්ත්වයක් තුළ මෙම තොරතුරු භාවිතා කරන්නන්ට ඔවුන්ට ලැබෙන තොරතුරුවල විශ්වාසනීයත්වය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ස්වාධීන පාර්ශවයන්ගෙන් ලැබෙන සහතික වීම ඉතා වැදගත් වේ.

සහතික වීමේ සේවාවන්
- උසස් මට්ටමක සහතික වීම → සාධාරණ සහතික වීම.
- මධ්‍යස්ථ මට්ටමක සහතික වීම → සීමිත සහතික වීම

## සහතිකවීමේ සේවාවක් යනු......

''එක් පාර්ශවයක් විසින් තවත් පාර්ශවයකගේ ප්‍රතිලාභයක් සඳහා සකස් කරන ලද තොරතුරු සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇති වෘත්තිකයෙකු ස්වාධීන මතයක් එල කිරීම සහතිකවීමේ සේවාවක් නම් වේ.''

''විෂය කරුණු ඇගයීම හෝ මිනුම් කිරීම පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් හැරෙන්නට එම විෂය කරුණු ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කරන්නන්ගේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීම සඳහා ස්වාධීන වෘත්තිකයෙකුගේ නිගමනය ප්‍රකාශ කිරීමට නිර්මාණය කර ඇති කාර්යභාරයන් සහතිකවීමේ සේවාවක් ලෙස හැඳින්වේ.''

## සහතිකවීමේ සේවාවක මූලිකාංග

- පාර්ශවයන් 03ක සම්බන්ධතාවය
  - මූල්‍ය වාර්තා පරිශීලකයන්.
  - මූල්‍ය වාර්තා පිළියෙල කරන්නන්.
  - පරිචයේ යෙදෙන්නන්.
- යෝග්‍ය විෂය කරුණ
- උචිත නිර්නායකයන්
- විගණන සාක්ෂි
- සහතිකවීමේ වාර්තාවක්

## විගණනයකදී විගණකවරයාට 100% ක සහතිකවීමක් ලබාදීමට නොහැකිවීමට හේතු / සහතිකවීමේ සේවාවන් වල ආවේණික සීමා

- නියදි පරීක්ෂණවල ස්වරූපය
- මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු භාවිතය
- ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතිවල ආවේණික සීමාවන්
- විගණක බොහෝ අවස්ථාවන් වලදී වෘත්තීමය විනිශ්චයන්ට එළඹීම
- විගණක ලබාගන්නා බොහෝ විගණන සාක්ෂි 100%ක්ම නිවැරදි නොවීම සහ මගපෙන්වන සුළු ඒවා වීම.

JMC vLearning "your virtual learning partner"

## සහතිකවීමේ සේවාවන්වල වාසි

- මූල්‍ය තොරතුරුවල ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය ඉහළ යාම්
- වාර්තා කරන තොරතුරුවල සාවද්‍යතාවයන් පවතියි නම් එම සාවද්‍යතාවයන් පිළිබඳව පරිශීලකයන්ගේ අවධානය යොමු කළ හැකි වීම
- ගනු ලබන ආර්ථිකමය තීරණ සඳහා උපකාරී වීම
- කළමනාකාරීත්වයට එම තොරතුරු වෙනස් කිරීමට ඇති ඉඩ ප්‍රස්ථාව අඩු වීම.

